ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,512 - 2026 ඔක්තෝබර් මස 23 සිකුරාදා - 2026.10.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

	පිටුව		පිටුව
තනතුරු ඇබෑර්තු	-	විභාග, විභාග ප්‍රතිඵල ආදිය	-

සැ.යු.: (i) ද ගුඩ්නස් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2026.10.16 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත 2026.10.16 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 නොවැම්බර් මස 13 දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම 2026 ඔක්තෝබර් මස 30 දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

ප්‍රසන්න ජයරත්න,
රජයේ මුද්‍රණාලයාධිපති.

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

0000 - B 82841 - (2026/10)
E - 01

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 නමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සැම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුටුවැසිකම් ලැබුවෙකි.

1.2 ජෝෂ්ඨ පාර්ශ්වකාලා සහනික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමින් වශයෙන් නියම නොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඒනු පෙෂ්ය පාර්ශ්වකාලා සහනික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවශ්‍යතාවෝවීන පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට කිසිතෙක් ලබන සුදුසුකම් පසු කාලක දී ලබා නියමිත නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සම්මත්වීමට අපොහොසත්වීම් නියා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම් අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ කොවිත භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටී නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීවූ මූදල් ඇරගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා ය.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් නිරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මූදලක් ඒම ලේකම් විසින් නිරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ වන්නා නොවන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිවූ පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කරුණු ද යටින් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනෙන් වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ ගෙන්වූවන් අතාදරීවා ගෙවිය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරිහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දායක වන පරිදි හා ඒම මිතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, අරගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් කාමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගෙන්නා අයෙ සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයෙකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කාර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත පුවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යතාව) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමක් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වූවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා කව මාස හයක කාලසීමාවක් ඇතුළත යශෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වූවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම්, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යශෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මේවැනි නිලධාරීන්ට පත්වීම් ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් ඇලලිය යුතුය. ඉන් පහතුරුවා අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු දකර, එම විභාගයෙන් අසමත් වූවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිවිඡේදයෙන් පසු ඒ සම්මත එළැඹෙන අවුරුදු දෙකක කාල පරිවිඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සම්මත්වීමට ඔහුට අවස්ථාව ලබලා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිවිඡේදය තුළ විභාගයෙන් සම්මත්වීමට නොහැකි වූවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රධිමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම් සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අගස්ත්‍යකයන් දිවයිනේ ඕනෑම උපඡෙදයක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගනුලබන යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයකින් ප්‍රමාණයට සමාන මුදලක් සුවිශේෂ වැටුපෙන් වැන්දඹු සහ අනාථදරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වේච්ඡාය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මූදල් විරමය අවසානයේ දී අනිවාර්ය දායක මූදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මූදල් ප්‍රමාණය මෙන් 150%ක මූදල් ප්‍රතිශතයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මූදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මූදලා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මූදලා හරිනු ලැබූ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්ගේ ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මූදලා හරිනු ලැබූ සුදු, නාවික සහ ගුවන් හමුදාවේ නිතිය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මූදා හරිනු ලැබූ සන්නද්ධ හමුදාවක යම් යාමාතිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අනිවේ තොවූ සේවා කාලපිමාව මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ පවහැනිව ගුණිත් සඳහන්ව නිශ්චිණ ද, මෙ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කොටසය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්ගේ සේවා මූකත හාටයින් ද, සහාය ගිනි නිවන, ගගක ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටී තම්න්ගේම ඕනෑකමින් එම සේවාවන්හිගෙන් අස්ව නොසිය අයව ද ඉහත කී සියලු සුදුසුකම් තිබෙ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවින් සනතුටුදායක ලෙස සහ අඛණ්ඩව සැපතිණි නම් ද, විසස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ව තම්න්ගේ වයස්වලින් 1939 ඔක්තෝබර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලපිමාව තුළ තම තම්න් සේවය කළ කාලයන් අවුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ සිර්ෂයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යම්කිසි නව තනතුරකට කෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මූදලාලිය හැකි ද නොගැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරනා විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වෛද්‍යවරු නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැනීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියක් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන තනතැනකු විසින් අයදුම්කරුට විරුද්ධ සහතිකයක් දීමෙන් එසස් කළ යුතු ය. යම් අයදුම්කරුවකු කෝරා ගන්නා අවස්ථාවේදී නවර අන්දමේ චුට්ට දැයක් හෝ අනුග්‍රහයක් පැතීම හෝ එයිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් හිටබන බැව් ඔහු කෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණේ නම් ඒ තේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, කෝරා ගැනීමේන් පසු ඒ බව අනාවරණය වුණේ නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් හේතුවනු ඇත.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබෙයි.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දිමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම් සඳහ උසස් කිරීම් සම්බන්ධ නව ආකෘතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කරන ලබන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති ඇංක 15/90, 1990.03.05 දිනැති ඇංක 15/90(I) සහ 1990.06.15 දිනැති ඇංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අඟයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ලැබේ.

විභාග අපේක්ෂකයින් සඳහා නීති සහ උපදෙස්

1976 අංක 19න් සංශෝධිත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනතේ විධිවිධානයන්ට සහ වරින්වර පනවනු ලබන නීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීමට සියලු විභාග අපේක්ෂකයින් බැඳී ඇත.

1976 අංක 19 සංශෝධිත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනතේ 20 වගන්තිය මගින් විභාග කොමසාරිස් ජනරාල්වරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත කොන්දේසි හා සීමා කිරීම් නියම කරනු ලැබේ.

සියලු විභාග අපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතු අතර මෙම නීති කිසිවක් උල්ලංඝනය කරන විභාග අපේක්ෂකයකුට විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි පහත දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකි ය.

(i) විමර්ශනයට භාජනය වූ මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම තහනම් කිරීම
(ii) විමර්ශනයට භාජනය වූ විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සකු කිරීම
(iii) මුළු ජීවිත කාලයටම විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන සියලු විභාගවලට පෙනී සිටීම තහනම් කිරීම
(iv) නිශ්චිත කාලවකවානුවක් සඳහා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවලට පෙනී සිටීම තහනම් කිරීම
(v) අත්හිටවූ විභාග තහනමක් සහිතව ලිපියක් නිකුත් කිරීම
(vi) සහතික පත්‍රය යම්කිසි කාලසීමාවක් තුළ තහනම් කිරීම
(vii) ප්‍රසිද්ධ විභාග පනත යටතේ අපරාධ නඩුවක් පැවරීම සඳහා විභාග අපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ එම ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම
(viii) විභාග අපේක්ෂකයා රජයේ සේවකයකු වන අවස්ථාවකදී විභාග අපේක්ෂකයාගේ ක්‍රියාපටිපාටිය සම්බන්ධයෙන් අදාළ විභාග අපේක්ෂකයාගේ පත්වීම් බලධාරියා වෙත (විනය ක්‍රියා මාර්ග ගැනීම සඳහා) වාර්තා කිරීම

විභාගයට පෙර හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ මොනයම් අවස්ථාවකදී වුවත් එවැනි විභාග අපේක්ෂකයකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

1. සියලුම විභාග අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී සහ විභාග පරිශ්‍රය තුළදී විභාග ශාලාධිපතිට සහ ඔහුගේ කාර්ය මණ්ඩලයට ද අනෙකුත් විභාග අපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස හැසිරිය යුතුය. එසේම, විභාග අපේක්ෂකයන් විභාග පරිශ්‍රයේ දේපළවලට හෝ විභාග කාර්ය මණ්ඩලයේ පෞද්ගලික දේපලවලට කිසිදු අන්දමකින් හෝ අලාභ හානි නොකළ යුතු ය.

2. විභාග අපේක්ෂකයින් විභාගය පවත්වාගෙන යන කාලසීමාව තුළදීත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතිගේ සහ ඔහුගේ කාර්ය මණ්ඩලයේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයට උත්තර ලිවීම ආරම්භ කර පැය භාගයක් ගත වූවාට පසු කිසිදු විභාග අපේක්ෂකයකු විභාග ශාලාවට ඇතුළු කර ගනු නොලැබේ. විභාගය අවසන් වන තුරු ද කිසිම අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටව යාමට ඉඩ ලබා දෙනු නොලැබේ. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට නියමිත වේලාවට සහභාගී වීමට කටයුතු කළ යුතු ය.

4. සෑම විභාග අපේක්ෂකයකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුය. තමන්ට නියම කරන ලද අසුන හැර වෙනත් තැනක අසුන් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදු වේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළතදී විභාග කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතා බහ කිරීම හෝ පණිවිඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන් ම තහනම් වේ.

6. විභාග අපේක්ෂකයකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ අපේක්ෂකයාගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම ලිවීම, උත්තර පත්‍රය හඳුනාගත හැකි වන අයුරින් යම් සලකුණක් හෝ සටහනක් යෙදීම, උත්තර පත්‍රවල අසභ්‍ය හෝ අනවශ්‍ය දේ ලිවීම, උත්තර පත්‍ර සමග මුදල් නෝට්ටු ඇමිණීම සපුරා තහනම් වේ. අන්‍ය විභාග අපේක්ෂකයකුගේ විභාග අංකය තම උත්තර පත්‍රයේ ලිවීම ද වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංක ලියා ඇති උත්තර පත්‍ර ද ප්‍රතික්ෂේප කිරීම සිදු කෙරෙනු ඇත.

7. තමන් වෙත විභාග ශාලාවේදී සපයන කඩදාසි (විභාගය පැවැත්වෙන දිනයට අදාළව නිරීක්ෂකගේ කෙටි අත්සන හා දිනය යොදා ඇති පිළිතුරු ලිවීමේ කඩදාසි) හැර ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙනත් තැනක හෝ කිසිවක් නොලිවිය යුතු ය. මෙම උපදෙස්වලට පටහැනිව කටයුතු කිරීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සලකනු ලැබේ.

8. විභාග අපේක්ෂකයින් වෙත සපයනු ලබන කඩදාසි හෝ පිළිතුරු ලියන පොතක් හෝ ඉරා දැමීම හෝ පොඩි කිරීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක් ම පැහැදිලිව කපා හැර උත්තර පත්‍රයට ඇමිණීම හෝ විභාගය අවසානයේ පිළිතුරු පත්‍ර සමග භාරදීම හෝ ලබා දෙන උපදෙස් පරිදි සිදු කළ යුතුය. විභාග ශාලාවේදී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටතට ගෙනයාම තහනම් වේ. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක නැවත ලියවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතු ය.

9. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම් ය. මෙම සියලු ද්‍රව්‍යයන් විභාග කොමසාරිස් ජනරාල් සතුවන අතර මෙම නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවක් ලෙස සලකනු ලැබේ.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන ලිපි ද්‍රව්‍ය හා එක් එක් විභාගයේදී ළඟ තබා ගැනීමට ලිඛිතව අවසරදී ඇති ද්‍රව්‍යයන් හැර වෙනත් සටහන් පොත්, සටහන් ඇතුළත් කොළ හෝ කොළ කැබලි යනාදිය විභාග ශාලාව තුළ විභාගයට පෙනී සිටින අවස්ථාවේදී තමා සන්තකයේ හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතු ය. එසේම විභාග ශාලාව තුළ දී ජංගම දුරකථන, විද්‍යුත් සන්නිවේදන උපකරණ / උපාංග (Electronic Communication Devices) තමා සන්තකයේ හෝ සමීපයෙහි තබා ගැනීම සහ එම උපකරණ / උපාංග භාවිතා කර බාහිර පාර්ශ්වයන්ගේ උදව් ලබා ගැනීම හා විභාගය පැවැත්වෙන අතරතුර වෙනත් පාර්ශ්ව හා සමාජ මාධ්‍ය වෙත තොරතුරු යැවීම වංචනික ක්‍රියාවක් සේම දඬුවම් ලැබිය හැකි වරදක් වන්නේ ය.

11. විද්‍යුත් සන්නිවේදන උපකරණ / උපාංග ඉහත 10 ඡේදයේ විස්තර කර ඇති කාර්යයන් සඳහා භාවිතා කර අසු වුවහොත් එම උපකරණ / උපාංග අදාළ විමර්ශන කටයුතු අවසන් වන තුරු විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ භාරයට ගැනීමට කටයුතු කරනු ලැබේ.

12. විභාග ශාලාවේ අසුන් ගැනීමෙන් පසු විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අවස්ථාවේදී කිසිම විභාග අපේක්ෂකයකු ළඟ, විභාගය සඳහා ගෙන ඒමට අවසර ලබාදී නොමැති කිසිදු ද්‍රව්‍යයක් හෝ උපකරණයක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන් ම තහනම් ය. විභාග ශාලාධිපති හෝ කාර්ය මණ්ඩලය නියම කළහොත් සෑම අපේක්ෂකයකුම තම සන්තකයේ තිබෙන දෑ සහතික කිරීමට සහ පරීක්ෂා කිරීමකට යටත් වන අතර මෙම අවශ්‍යතා කඩ කිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට උත්සහ දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. යම් අපේක්ෂකයකු වෙනත් අපේක්ෂකයකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ සංඥා මගින් හෝ වෙන කිසිවකින් හෝ කොපි කිරීම හෝ කොපි කිරීමට ප්‍රයත්න දැරීම හෝ වංචා සහගත ලෙස කටයුතු කිරීම හෝ වරදක් වන්නේ ය. වෙන අයදුම්කරුවකුට උදව් දීම ද වෙන අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් හෝ විභාග කාර්ය මණ්ඩලයෙන් හෝ උදව් ලබා ගැනීම ද වරදක් වන අතර උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසියට යටින් තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතු ය.

14. විභාගය ආරම්භ වී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයකුට ඉඩ දෙනු නො ලැබේ. එහෙත් වැසිකිළි/කැසිකිළි යාමට අවශ්‍යතාවයක් උදෙසා විභාග අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටතට යන්නට වුවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර කාර්ය මණ්ඩලයේ නිලධාරියකුගේ සුපරීක්ෂාකාරිත්වය යටතේ අපේක්ෂකයාට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එලෙස පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු/ඇය සෝදිසියකට භාජනය විය යුතු ය.

15. විභාග ශාලාවේ පිළිතුරු ලිවීමට පටන් ගැනීමට පෙර හෝ පසුව නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවක් වන්නේය. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ ව්‍යාජ අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීම වංචනික ක්‍රියාවක් ලෙස සලකනු ලැබේ.

16.විභාග අපේක්ෂකයකු හෝ විභාග අපේක්ෂකයකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

17. විභාග අපේක්ෂකයන් පහත උපදෙස් පරිදි ක්‍රියා කළ යුතු ය. :

(i) සෑම විභාග අපේක්ෂකයෙකුම තම ප්‍රවේශ පත්‍රයේ අත්සන සහතික කර ගැනීමත්, ඉල්ලුම් කරන ලද විෂයයන් හා ප්‍රවේශ පත්‍රයේ සඳහන් විෂයයන් අතර නොගැලපීමක් පවතින්නේ නම් විභාග දෙපාර්තමේන්තුව විමසා විභාගයට පෙර සංශෝධනය කර ගැනීමත් සිදු කළ යුතු ය.

(ii) විභාගය පටන් ගැනීමට පැය බාගයකට (1/2) පෙර විභාග ශාලාව වෙත පැමිණීම සුදුසු වන අතර විභාග ශාලාව නිශ්චිතව නොදන්නා විට විභාගය පටන් ගන්නා දිනට කලින් ඒ පිළිබඳ සොයා බලා නියම ස්ථානය නිශ්චිතව හඳුනා ගැනීම යෝග්‍ය වේ.

(iii) විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍රය ඉදිරිපත් කර තම අනන්‍යතාව තහවුරු කළයුතු ය.

(අ). අනන්‍යතාව ඔප්පු කිරීමට අවශ්‍ය ලේඛන විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට කටයුතු කරන අතර, යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ පිළිබඳ විභාග ශාලාධිපති දැනුවත් කර විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීම කටයුතු කළයුතු ය.

(ආ). සෑම අපේක්ෂකයකුම තම අනන්‍යතාව පැහැදිලිව පෙනෙන ලෙස සම්පූර්ණ මුහුණ හොඳින් හඳුනාගත හැකිවන අයුරින් විභාගය පැවැත්වෙන කාලසීමාව තුළ විභාග ශාලාවේ රැඳී සිටිය යුතු ය.

(iv) විභාග අපේක්ෂකයන් බලුටුත් වැනි විද්‍යුත් සන්නිවේදන උපකරණ / උපාංග (Electronic Communication Devices) භාවිතා නොකරන බව සහතික කර ගැනීම සඳහා විභාග ශාලාවේදී තම දෙකන විවෘතව පැහැදිලිව පෙනෙන ලෙස තබාගත යුතු ය.

(v) විභාග ශාලාවේදී ඔබට ලබා දෙනු ලබන කඩදාසි හැර වෙන මොන ම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුය. ඉතිරිවන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ මේසය මත තබා යා යුතු ය.

(vi) විභාග අපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, මකන, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතු ය.

(vii) තමන් භාවිතා කරන පිළිතුරු ලිවීමේ පොත සහ සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තමන්ගේ විභාග අංකය පැහැදිලිව සඳහන් කළ යුතු ය. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද, පිරිසිදුව ද උත්තර ලිවිය යුතු ය. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු එම ප්‍රශ්නයේ ම අනෙක් කොටස පටන් ගැනීමට පෙර එක් රූලක්වත් හිස්ව තිබිය යුතුය. සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු අලුත් පිටුවකින් ආරම්භ කළ යුතු ය.

(viii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන් කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුය. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතු වන බැවින් ප්‍රශ්න අංක නිවැරදිව යෙදීමට කටයුතු කළ යුතු ය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද, සෑහෙන පමණ විශාලව ද තිබිය යුතු ය.

(x) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරාගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින් සඳහන් කර ඇති උපදෙස් හොඳින් කියවා බැලිය යුතුය. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට අනුව පිළිතුරු ලබාදී නොමැති අවස්ථාවලදී ලකුණු ලබා දීම සිදු කරනු නොලැබේ.

(xi) එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද පොතට අමතරව ලියන කඩදාසි පිටු අංක පිළිවෙළ අනුව එකතුකර වම් පැත්තේ ඉහළ කෙළවරේ නොගැලවෙන සේ ගැටගැසීම / ඇමිණීම කළයුතුය. පිළිතුරු පත්‍රය භාරදීමට පෙර සියලුම පිළිතුරු ලියූ කොළ අමුණා තිබේද යන්න තහවුරු කරගත යුතුය. පිළිතුරු පත්‍ර භාරදුන් පසුව විභාග මධ්‍යස්ථානයෙන් බැහැරට ගෙන ගිය කිසිදු පිළිතුරු ලියූ කඩදාසියක් ඇගයීමට ලක් කරනු නොලැබේ.

(xii) ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට හෝ ඔහුගේ කාර්යය මණ්ඩලයේ නිලධාරියකුට භාරදිය යුතුය. උත්තර පත්‍ර එකතු කරන තුරු ඔබගේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම්විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකි ය.

(xiii) යම් කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතිට හෝ ඔහුගේ කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකුට කථා කිරීමට අවශ්‍ය වූ විට අන් අයට බාධාවක් නොවන සේ දෙවරක් මේසයට තට්ටු කිරීමෙන් සංඥා කළ යුතු ය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

තනතුරු - ඇබෑර්තු

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය

කම්කරු විනිශ්චය සභා සහකාර ලේකම් තනතුර සඳහා බඳවා ගැනීම - 2026

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය යටතේ කම්කරු විනිශ්චයාධිකාරයන් හි පුරප්පාඩුව පවතින සහකාර ලේකම් තනතුරු 13 ක් සඳහා බඳවා ගැනීමට සුදුසුකම් සපුරාලන ඒකාබද්ධ සේවයට අයත් කළමනාකරණ සේවා නිලධාරී I ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශ නිල වෙබ් අඩවියෙහි පල කර ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර **ලේකම්, කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලය, අංක 19, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. කවරයේ වම් පස ඉහළ කෙලවරේ **"කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලයේ කම්කරු විනිශ්චය සභා සහකාර ලේකම් තනතුර සඳහා බඳවා ගැනීම"** යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය.

අයදුම්පත් කැඳවන අවසාන දිනය **2026.11.23** දින වේ.

අයදුම්පත් යොමු කළ හැක්කේ ඒකාබද්ධ සේවයේ නියුතු කළමනාකරණ සේවා නිලධාරී I ශ්‍රේණියේ නිලධාරීන්ට පමණි.

සටහන - ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා අයදුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභානි අයදුම්කරුවන් විසින්ම විඳ දරාගත යුතු ය.

01. අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ලේකම් විසින් අයදුම්පත් කැඳවා, එම අමාත්‍යාංශ ලේකම් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා බඳවා ගැනීම් සිදු කරනු ලබයි.

02. තනතුරේ ස්වභාවය -
මෙම තනතුර ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත වේ.

03. වැටුප් පරිමාණය -
MN 2 – 2025 - රු.48,470-10X540-11X630-10X1,010-10X1,190 – රු. 82,800/-

04. මූලික සුදුසුකම් -

ඒකාබද්ධ සේවයට අයත් කළමනාකරණ සේවා නිලධාරී I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.

05. කෝරා ගනු ලබන ක්‍රමය -

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු මත කුසලතා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු වලට බඳවා ගනු ලැබේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු දීමේ පරිපාටිය, පුරප්පාඩු පවතින කම්කරු විනිශ්චයාධිකාරයන්ගේ තොරතුරු හා ආදර්ශ අයදුම්පත්‍රය අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශ නිල වෙබ් අඩවියේ (www.moj.gov.lk) පළ කර ඇත.

06. ඉල්ලුම් පත්‍රයට අදාළ තොරතුරු තම අත් අකුරින්ම පැහැදිලිව ඇතුලත් කළ යුතු ය. සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන, මූලික සුදුසුකම් නොමැති, නියමිත දිනට පසුව ලැබෙන හා ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ ඉල්ලුම් පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත මේ සමඟ ඇති ආදර්ශ ඉල්ලුම් පතට අනුව සැකසිය යුතුය. ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වනු නොලැබේ.

සියලුම අයදුම්පත් තමන් දැනට සේවයේ නියුතු ආයතන ප්‍රධානියා මඟින් යොමු කළ යුතු වේ.

07. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙනොත්, ඒ සම්බන්ධව අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් පොදු නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

08. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය අනුව කටයුතු කළ යුතු ය.

ජනාධිපති නීතිඥ අයෙෂා ජිනසේන,
ලේකම්.
අධිකරණ සහ ජාතික
ඒකාබද්ධතා අමාත්‍යාංශය.

2026 ඔක්තෝබර් මස 07 වැනි දින,
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය,
අංක 19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.

අංකය ..... (කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)		
භාෂා මාධ්‍යය	සිංහල	
	දෙමළ	

ආදර්ශ අයදුම්පත්‍රය
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය

කම්කරු විනිශ්චය සභා සහකාර ලේකම් තනතුර සඳහා වන අයදුම් පත්‍රය

01. (අ) මුලකුරු සමහ නම (සිංහලෙන්/දෙමළෙන්) - .....
.....

මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) - .....
.....

(ආ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) - .....
.....

සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) - .....
.....

02. ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) - .....
.....

03. ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) - .....
.....

04. ලිපි එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) - .....
(ස්ථිර ලිපිනයෙන් වෙනස් වේ නම් පමණක් සම්පූර්ණ කරන්න).....

05. දූරකථන අංකය - පෞද්ගලික: ..... කාර්යාලය: .....
(වට්ස් ඇප්)

06. විද්‍යුත් තැපැල් ලිපිනය - .....

07. ජාතික හැඳුනුම්පත් අංකය -

08. ස්ත්‍රී/පුරුෂ භාවය -

ස්ත්‍රී	
පුරුෂ	
වෙනත්	

09. උපන් දිනය - වර්ෂය ..... මාස ..... දින .....

10. පුරවැසිභාවය - .....

11. විවාහක/අවිවාහක බව - .....

12. වර්තමාන සේවා ස්ථානය සහ තනතුර -
.....
.....

13. කළමනාකරණ සේවා නිලධාරි I ශ්‍රේණියට පත් වූ දිනය - .....

14. වෙනත් සුදුසුකම් (ලකුණු දීමේ පටිපාටියෙහි දක්වා ඇති තොරතුරු අනුව සඳහන් කරන්න) - .....
.....
.....
.....
.....

15. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?
[අදාළ කොටුවේ (√) ලකුණ යොදන්න] ඔව් ☐ නැත ☐

(ඔව් නම් විස්තර සඳහන් කරන්න) .....
.....

16. ඔබ සම්බන්ධව යම් නොවිසඳුනු විනය ක්‍රියාමාර්ගයක් පවතී ද?
[අදාළ කොටුවේ (√) ලකුණ යොදන්න] ඔව් ☐ නැත ☐

(ඔව් නම් විස්තර සඳහන් කරන්න) .....
.....

17. ඔබ සුදුසුකම් මත නෝරා ගතහොත් අනුයුක්ත වීමට මනාපය පල කරන කම්කරු විනිශ්චයාධිකාර 03 ක් අනුපිළිවෙලින් සඳහන් කරන්න.

1. .....
2. .....
3. .....

(කම්කරු විනිශ්චයාධිකාර ලැයිස්තුව අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශ නිල වෙබ් අඩවියේ පල කර ඇති අතර, ඔබ විසින් මනාපය පල කරන ආයතනයක් සඳහාම අනුයුක්ත කරන බවට සහතිකයක් ලෙස මෙය නොසැළකිය යුතු ය.)

18. **අයදුම්කරුගේ සහතිකය :**

I. මෙම ඉල්ලුම් පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශකර සිටිමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තව ද, මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

II. මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍යය යැයි ඔප්පු වුවහොත්, පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු ස්වයෙන් පහකරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

III. මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

....., ...,
දිනය අයදුම්කරුගේ අත්සන.

19. **අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ..... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ...../...../..... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව සහතික කරමි.

....., ...,
දිනය අත්සන සහතික කරන
නිලධාරියාගේ අත්සන.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම : .....
තනතුර : .....
ලිපිනය : .....
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

20. ආයතන ප්‍රධානියාගේ සහතිකය :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ..... මයා/මිය/මෙනවිය ...../...../..... දින සිට ..... ආයතනයේ ස්ථීර/තාවකාලික/අනියම් නිලධාරියෙකු/නිලධාරිනියක වශයෙන් සේවය කරන බවත්, ඔහු / ඇය විසින් ඉහතින් සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බවත්, නිලධාරියා සම්බන්ධව නොවිසඳුනු විනය කටයුත්තක් ඇති / නැති බවත්, යම් විනය කටයුත්තක් ආරම්භ කිරීමට නියමිත / නියමිත නැති බවත්, අයදුම්පත් කැඳවීමේ නිවේදනය ප්‍රකාරව ඔහු / ඇය මේ සඳහා පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බවත්, එම නිවේදනයෙහි සඳහන් රෙගුලාසි ප්‍රකාරව ඔහු / ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු / ඇය සේවයෙන් නිදහස් කළ හැකි / නොහැකි බවත් දන්වමි.

.....,
ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව.

දිනය - .....
නම - .....
තනතුර - .....
අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව - .....

ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු දීමේ ක්‍රමය

01. කාර්මික ආරවුල් පනත පිළිබඳ දැනුම - ලකුණු 10

02. ලංකාවේ අධිකරණ ක්ෂේත්‍රය පිළිබඳ දැනුම - ලකුණු 10

03. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් : - ලකුණු 40

I. සහතික පත්‍ර පාඨමාලා - ලකුණු 10

- රජයේ පිළිගත් ආයතනයක් විසින් පිරිනමන ලද සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා
(එක් සහතික පත්‍රයකට ලකුණු 02 බැගින් උපරිම සහතික පත්‍ර 05ක් සඳහා)

II. පුහුණුවීම් - ලකුණු 10

- සමස්ථ සේවා කාලය තුළ ආයතන සංග්‍රහය, මූදල් රෙගුලාසි, මානව සම්පත් කළමනාකරණය, මහජන සම්බන්ධතා, වැටුප්, විනය, පෞද්ගලික ලිපිගොනු ආදිය හා රාජකාරී විෂයය ක්ෂේත්‍ර ආවරණ වන පරිදි ලබාගෙන ඇති පුහුණුවීම් සඳහා
(එක් සහතික පත්‍රයකට ලකුණු 02 බැගින් උපරිම සහතික පත්‍ර 05ක් සඳහා)

III. ඉංග්‍රීසි දැනුම - ලකුණු 10

- ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා - මාස 06-12 දක්වා (ලකුණු 10)
- සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා - මාස 03-06 දක්වා (ලකුණු 05)
- වෙනත් (ලකුණු 03)

(ඉහළම සුදුසුකම සඳහා ලකුණු ලබා දීම සිදු වේ.)

IV. පරිගණක දැනුම - ලකුණු 10

- ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා - මාස 06-12 දක්වා (ලකුණු 10)
- සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා - මාස 03-06 දක්වා (ලකුණු 05)
- වෙනත් (ලකුණු 03)

(ඉහළම සුදුසුකම සඳහා ලකුණු ලබා දීම සිදු වේ.)

04. ජ්‍යෙෂ්ඨත්වය : - ලකුණු 10

කළමනාකරණ සේවා නිලධාරි I ශ්‍රේණියේ සේවා කාලය සඳහා

- වසරකට ලකුණු 01 බැගින් උපරිම වසර 10ක් සඳහා
- වසරකට අඩු හා මාස 06කට වැඩි කාලසීමාවක් සඳහා ලකුණු 0.5
- මාස 06කට අඩු හා මාස 03කට වැඩි කාලසීමාවක් සඳහා ලකුණු 0.25

සටහන :
- මාස 03ට අඩු කාලයක් සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

05. සේවා පළපුරුද්ද : - ලකුණු 15

- කම්කරු විනිශ්චය සහ ලේකම් කාර්යාලයේ හෝ කම්කරු විනිශ්චය සහාවක කළමනාකරණ සේවා නිලධාරි ලෙස සේවය කර තිබීම (වසරකට ලකුණු 01 බැගින් උපරිම වසර 10ක් සඳහා) - ලකුණු 10
- ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි ලෙස සේවය කිරීම - ලකුණු 05 (වසරකට ලකුණු 01 බැගින් උපරිම වසර 05ක් සඳහා)

සටහන :

- සේවා පළපුරුද්ද සඳහා මාස 06කට නොඅඩු හා වසරකට අඩු කාලසීමාවක් සඳහා වසරකට හිමිවන ලකුණු ප්‍රමාණයෙන් අඩක් හිමි වේ. කෙසේ වුව ද මාස 03කට අඩු සේවා කාලයන් සඳහා ලකුණු ලබාදෙනු නොලැබේ.

- සේවා පළපුරුද්ද සම්බන්ධයෙන් ඉදිරිපත් කරන තොරතුරු අදාළ ආයතන වෙතින් නිකුත් කළ ලේඛන මගින් තහවුරු කළ යුතු ය.

06. සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා - ලකුණු 15

- සන්නිවේදන හැකියාව (ලකුණු 05)
- නායකත්වය (ලකුණු 05)
- පෞරුෂත්වය (ලකුණු 05)

එකතුව **ලකුණු 100**

සහකාර ලේකම් තනතුර පුරප්පාඩුව පවතින කම්කරු විනිශ්චයාධිකාරයන්

කම්කරු විනිශ්චය සභා අංකය	*ලිපිනය*
09	අධිකරණ සංකීර්ණය, නුවරඑළිය
10	4/26, සාන්තු නිවාස පාර, හැටන්
19	මහාධිකරණ භූමිය, අවිස්සාවේල්ල
26	අධිකරණ සංකීර්ණය, ලැබීම, කඹුරුගමුව
28	අධිකරණ සංකීර්ණය, හලාවත

කම්කරු විනිශ්චය සභා අංකය	*ලිපිනය*
33	නව අධිකරණ සංකීර්ණය, හෝමාගම
34	පැරණි මොරවක මහෙස්ත්‍රාත් අධිකරණ ගොඩනැගිල්ල, ගල්දොළ, කොටපොල
36	වැලිමඩ පාර, බණ්ඩාරවෙල
38	නව අධිකරණ සංකීර්ණය, බේලි පාර, නාවලපිටිය
39	පලාපන්වල, මාතලේ
44	උසාවි සංකීර්ණය, අම්පාර
ත්‍රිකුණාමලය	උසාවි සංකීර්ණය, ත්‍රිකුණාමලය
යාපනය	03 වන මහල, මහාධිකරණ සංකීර්ණය, යාපනය

**නව බඳවාගැනීම් වලදී අභ්‍යන්තර ස්ථාන මාරු ලබා දීම සම්බන්ධව ද සලකා බලන බැවින් ඉහත පුරප්පාඩු පවතින ස්ථාන, සුළු වශයෙන් වෙනස් විය හැකි ය.

10 - 689

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරී තනතුරට බඳවා ගැනීම - 2026

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/CAD/MOH/CM/Vol.V හා 2026.09.23 දිනැති ලිපිය හා අංක 2199/10 හා 2020.10.27 දිනැති ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ සේවා ව්‍යවස්ථාව හා සංශෝධනවලට අනුකූලව ආයුර්වේද දෙපාර්තමේන්තුවේ වෛද්‍ය නිලධර ගණයේ ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරී පුරප්පාඩු තනතුරු 177 ක් සඳහා බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

ඒ අනුව මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් 2026 නොවැම්බර් මස 16 දිනට සපුරාලන සුදුස්සන් තෝරා ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ නියමය පරිදි සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර ආයුර්වේද කොමසාරිස් ජනරාල්, ආයුර්වේද දෙපාර්තමේන්තුව, පරණ කොට්ටාව පාර, නාවින්න, මහරගම ලිපිනය වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරී තනතුරට බඳවා ගැනීම - 2026"** යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය. තව ද, බඳවා ගැනීමේ අයදුම්පත්‍රයේ සඳහන් කරන නම සිංහල මාධ්‍ය අයදුම්කරුවන් විසින් සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි බසින් ද, දෙමළ මාධ්‍ය අයදුම්කරුවන් විසින් දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි බසින් ද සඳහන් කළ යුතු ය.

අයදුම්පත් කැඳවන අවසාන දිනය 2026 නොවැම්බර් මස 16 දින වේ.

සටහන : අයදුම්පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් නැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා අයදුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි පාඩුව අයදුම්කරුවන් විසින් ම විඳදරා ගත යුතු ය.

01. සේවයට බඳවා ගැනීමේ ක්‍රමවේදය :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ආයුර්වේද/ සිද්ධ/ යුනානි උපාධිය ලත් උපාධිධාරීන් අදාළ වර්ෂවල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන කුසලතා ලේඛනයේ අනුපිළිවෙල පදනම් කරගෙන බඳවාගනු ලැබේ. වසර කිහිපයකට අදාළ උපාධිධාරීන් අයදුම්කරුවන් ලෙස ඉදිරිපත් වන අවස්ථාවක දී ඒ ඒ වර්ෂයන්හි කුසලතා ලේඛනය පදනම් කර ගනිමින් එම කුසලතා ලේඛනයෙහි සඳහන් අනුපිළිවෙලට ප්‍රමුඛතාවය දෙමින් පත්කිරීම් බලධරයා විසින් පත් කරන ලද සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

02. බඳවා ගන්නා ශ්‍රේණිය : ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ ප්‍රාථමික ශ්‍රේණිය